ශ්‍රී ලංකා

ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ

පාර්ලිමේන්තුව

# 1981 අංක 50 දරන තුවක්කු (සංශෝධන) පනත

[සහතිකය සටහන් කළේ 1981 අගෝස්තු මස 28 වන දින]

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී.

1981 සැප්තැම්බර් මස 04 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ II වන කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී

කොළඹ රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිළ දී ලබාගත හැකිය

මිළ : ශත 20 යි                    තැපැල් ගාස්තුව : ශත 50 යි

## 1981 අංක 50 දරන තුවක්කු (සංශෝධන) පනත

[සහතිකය සටහන් කළේ 1981 අගෝස්තු මස 28 වන දින]

**එල්.ඩී.—ඕ.** 5/81

**තුවක්කු ආඥාපනත සංශෝධනය කිරීම සඳහා වූ පනතකි.**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ :—

**1.** මේ පනත 1981 අංක 50 දරන තුවක්කු (සංශෝධන) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ. *ලුහුඬු නාමය.*

**2.** 1980 අංක 8 දරන පනතින් සංශෝධිත තුවක්කු ආඥාපනතෙහි 24 වන වගන්තිය ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන වගන්තිය ආදේශ කිරීමෙන් ඒ ආඥාපනත මෙයින් තවදුරටත් සංශෝධනය කරනු ලැබේ :— *182 වන අධිකාරයේ 24 වන වගන්තිය ප්‍රතිස්ථාපනය කිරීම.*

"බලපත්‍ර සඳහා මුද්දර ගාස්තු.

24. 23 වන වගන්තිය යටතේ නිකුත් කරනු ලබන සෑම බලපත්‍රයක් සම්බන්ධයෙන් ම, අවස්ථාවෝචිත පරිදි, යම් කෘෂිකාර්මික කාර්යයක් සඳහා හෝ කෘෂිකාර්මික කාර්යයක් නොවන යම් කාර්යයක් සඳහා හෝ භාවිත කරනු ලබන යම් තුවක්කුවක් වෙනුවෙන් පහත සඳහන් පරිමාණවලට අනුකූලව මුද්දර මගින් ගෙවිය යුතු වාර්ෂික ගාස්තුවක් අයකරනු ලැබිය යුතු ය :—

| | කෘෂිකාර්මික කාර්යයක් සඳහා | කෘෂිකාර්මික කාර්යයක් නොවන වෙනත් කාර්යයක් සඳහා |
|---|---|---|
| | රු. ශ. | රු. ශ. |
| (අ) සෑම බෙහෙත් තුවක්කුවක් සඳහා ... | එක් කාණ්ඩුවට 5.00 | එක් කාණ්ඩුවට 10.00 |
| (ආ) සෑම පතරොම් තුවක්කුවක් සඳහා ... | එක් කාණ්ඩුවට 10.00 | එක් කාණ්ඩුවට 20.00 |
| (ඇ) සෑම රයිෆල් තුවක්කුවක් සඳහා ... ... | 25.00 ... | 50.00 |
| (ඈ) සෑම පිස්තෝලයක් හෝ රිවෝල්වරයක් සඳහා ... | 50.00 ... | 100.00." |

ඒ 57173--12,725 (81/06)

පාර්ලිමේන්තුවේ පනත් කෙටුම්පත්වල සහ නීතිවල වාර්ෂික දායක මිළ (දේශීය) රු. 30 කි. (විදේශීය) රු. 40 කි. කොළඹ 1, තැ. පෙ. අංක 500, රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරී වෙත සෑම වර්ෂයකම දෙසැම්බර් මස 15 වැනි දිනට පෙර දායක මුදල් ගෙවා පසුව එළඹෙන එක් එක් වර්ෂය සඳහා ඒවා ලබාගත හැකිය.